කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2017/2018

**INR 3268: මානව ආරක්ෂාව ජාත්‍යන්තරීකරණය**

**කාලය: පැ දෙකයි (02)**

ඕනෑම ප්‍රශ්න **තුනකට (03)** පිළිතුරු සපයන්න

---

1. ප්‍රශ්න **දෙකටම (02)** පිළිතුරු සපයන්න.
   i. අදාළ උදාහරණ දක්වමින් මානව ආරක්ෂාව පිළිබඳ පටු නිර්වචනය සහ පුළුල් නිර්වචනය සංසන්දනය කරන්න.
   ii. ජපානයෙහි **හෝ** කැනඩාවෙහි විදේශ ප්‍රතිපත්ති රාමුවට මානව ආරක්ෂාව පිළිබඳ විවාදයෙහි බලපෑම සිදුවී ඇති අයුරු පැහැදිලි කරන්න.

2. සරණාගතයින් විසින් ඔවුන්ගේ මවුරට හැර යාමට තීරණය කරන මොහොතේ සිට ඔවුන්ගේ ජීවිත වලට මානව ආරක්ෂාවේ සංරචක හත (07) බලපාන්නේ කෙසේ දැයි විවේචනාත්මකව විභාග කරන්න.

3. රෝලන්ඩ් පැරිස් (Roland Paris) විසින් මානව ආරක්ෂාව සම්බන්ධව දැක්වූ විචාරයන්හි වලංගුභාවය සුදුසු තර්කයන් දක්වමින් විශ්ලේෂණය කරන්න.

4. දේශගුණ ක්‍රියාකාරීත්වය පිළිබඳව එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයා (United Nations Special Envoy for Climate Action) ලෙස දේශගුණ විපර්යාසයෙහි විවිධ බලපෑම් මානව ආරක්ෂාවට එල්ල වීම හා මේ සඳහා ක්‍රියාත්මක වීමට ඇති අවශ්‍යතාවය අවධාරණය කරමින් වාර්තාවක් ලියන්න.

5. ප්‍රශ්න **දෙකටම (02)** පිළිතුරු සපයන්න.
   i. "කාන්දු වීමේ න්‍යාය" (Trickle-Down theory) පැහැදිලි කරන්න.
   ii. සංවර්ධනය නිසා පුද්ගලයින්ගේ මානව ආරක්ෂාවට බාධාවක් එල්ල වේදැයි විස්තරාත්මක රචනයක් ලියන්න.

6. පහත සඳහන් ඕනෑම **තුනක් (03)** පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   i. පුද්ගලානුබද්ධ ආරක්ෂාව සහ විෂයානුබද්ධ ආරක්ෂාව (Subjective Security and Objective Security)
   ii. මහ්බූබ් උල් හක් (Mahbub ul Haq)
   iii. ආරක්ෂාව සඳහා වූ වගකීම සංකල්පය (Concept of Responsibility to Protect - R2P)
   iv. අවමානයෙන් නිදහස් වීම (Freedom from Indignity)
   v. එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුව (United Nations Framework for Climate Change, UNFCC)

*************